72, පාර්ක් වීදිය, කොළඹ-2, ශ්‍රී ලංකාව
දු.ක: +94 11 231 4041/2/3/5 ෆැක්ස්: +94 11 231 4040
විද්‍යුත් තැපැල: info@ihp.lk වෙබ්: www.ihp.lk ට්විටර්: @ihplk

## මාධ්‍ය ප්‍රකාශය

**නිකුත් කිරීම**

දිනය: 2023 මැයි 26
වේලාව: ශ්‍රී ලංකා වේලාවෙන් පෙ.ව. 12:01

**වැඩිදුර තොරතුරු සඳහා සම්බන්ධ කර ගැනීමට**

ඩැල්රීන් බාත්ලට්
විද්‍යුත් තැපැල: dalreen `at' ihp.lk


**ප්‍රධාන විමර්ශකයා සම්බන්ධ කර ගැනීමට**

ආචාර්ය රවී රන්නන්-එලිය
විද්‍යුත් තැපැල: ravi `at' ihp.lk ට්විටර්: @ravirannaneliya

# අනුර කුමාර දිසානායකට ලැබෙන සහයෝගය 45% දක්වා පහත වැටුණත් ඔහු තවමත් සජිත් ප්‍රේමදාස (37%) ට වඩා පෙරමුණෙන් සිටියි.

*2023 අප්‍රේල් IHP ජනාධිපතිවරණ ඡන්ද අභිප්‍රාය යාවත්කාලීන කිරීම.*


IHP අප්‍රේල් මස ශ්‍රී ලංකා මත විමසුම් සමීක්ෂණයේ (SLOTS) MRP ජනාධිපතිවරණ ඡන්ද අභිප්‍රාය පිළිබඳ සොයාගැනීම් වලට අනුව, ජා.ජ.බ./ජ.වි.පෙ. නායක අනුර කුමාර දිසානායක සඳහා සහයෝගය 45% දක්වා පහත වැටුණද ඔහු තවමත් 37% සහයක් පෙන්වන ස.ජ.බ. නායක සජිත් ප්‍රේමදාසට වඩා ඉදිරියෙන් සිටියි. බොහෝ දුරට අනුර කුමාර දිසානායකට තිබූ සහයෝගය අඩුවීමේ වාසිය ලබා ගෙන ඇත්තේ, ලකුණු 3කින් වැඩිව 13% මට්ටම දක්වා ලඟා වූ ජනාධිපති රනිල් වික්‍රමසිංහ සහ ලකුණු 1කින් වැඩිව 6% මට්ටමට ලඟා වූ ශ්‍රී.ල.පො.පෙ. අපේක්ෂකයායි. ඇස්තමේන්තු 1-4% ක දෝෂ ආන්තිකය සමඟ නිර්ණය කර ඇත.



අප්‍රේල් මාසයේ දී ජනාධිපති වික්‍රමසිංහ විසින් ලබා ඇති සහයෝගයේ වර්ධනය, අපගේ SLOTS මහ මැතිවරණ ඡන්ද අභිප්‍රාය අගයන් ඇස්තමේන්තුවේදී එ.ජා.ප.යට ලැබෙන සහයේ වැඩිවීමට සහ මෑත කාලීනව පාරිභෝගික විශ්වාසයේ ඇතිවූ වර්ධනය සමඟ අනුකූල වේ. මෑත කාලීන IMF ගිවිසුම සහ සමහර ආර්ථික දර්ශකවල ස්ථාවරත්වය, ජනාධිපතිවරයාට මෙන්ම ඔහුගේ පක්ෂයට ඇති සහය වැඩි වීමට හේතු වී ඇති නමුත් ශ්‍රී.ල.පො.පෙ.ට බලපෑමක් නොවූ බවට සාක්ෂි දරයි.

## IHP SLOTS ජනාධිපතිවරණ ඡන්දය ප්‍රකාශ කිරීමේ අභිප්‍රාය, (අපේක්ෂිත ඡන්දදායකයින් %)

අද ජනාධිපතිවරණයක් පැවතුණි නම්, ඔබ ඡන්දය ලබා දෙන්නේ කාටද?





**සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, ශ්‍රී ලංකා මත විමසුම් සමීක්ෂණය MRP**

2021 අගෝස්තු 31 සිට 2023 මැයි 19 දක්වා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ 11,368 මත මාසික ඇස්තමේන්තු පදනම් වේ. MRP ආකෘතියකින් ඇස්තමේන්තු ව්‍යුත්පන්න කර ඇති අතර මාසය සහ පක්ෂය අනුව 1-7% ක දෝෂ ආන්තිකයක් සමඟ තක්සේරු කර ඇත. ආරම්භයේදී ශ්‍රී.ල.පො.පෙ සඳහා "ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ" පිළිබඳව විමසුවද පසුව "ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සාමාජිකයෙක්" ලෙස එය විමසන ලදී.

## ගෝඨාභය රාජපක්ෂ ඡන්දදායකයින්ගේ වත්මන් ව්‍යාප්තිය (2019 ගෝඨාභය රාජපක්ෂ ඡන්ද දායකයින් %)

අද ජනාධිපතිවරණයක් පැවතුණි නම්, ඔබ ඡන්දය ලබා දෙන්නේ කාටද?




**සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, ශ්‍රී ලංකා මත විමසුම් සමීක්ෂණය MRP**

2021 අගෝස්තු 31 සිට 2023 මැයි 19 දක්වා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ 11,368 මත මාසික ඇස්තමේන්තු පදනම් වේ. MRP ආකෘතියකින් ව්‍යුත්පන්න කර ඇති අතර මාසය සහ පක්ෂය අනුව 1-7% ක දෝෂ ආන්තිකයක් සමඟ තක්සේරු කර ඇත. ආරම්භයේදී ශ්‍රී.ල.පො.පෙ සඳහා "ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ" පිළිබඳව විමසුවද පසුව "ගෝඨාභය රාජපක්ෂ හෝ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සාමාජිකයෙක්" ලෙස එය විමසන ලදී.

SLOTS ප්‍රධාන විමර්ශක සහ IHP විධායක අධ්‍යක්ෂ ආචාර්ය රන්නන්-එලිය මහතා අදහස් දක්වමින් කියා සිටියේ, "මෑත කාලීන ඡන්දය ප්‍රකාශ කිරීමේ අභිප්‍රායේ ප්‍රවණතා දිගින් දිගටම පෙන්වා දෙන්නේ සජිත් ප්‍රේමදාස, හිටපු ගෝඨාභය රාජපක්ෂ ඡන්දදායකයින්ගේ සහයෝගය ලබා ගැනීමට අසමත් වූ බවයි. 2023 අප්‍රේල් වන විට, හිටපු රාජපක්ෂ ඡන්දදායකයින් පස් දෙනෙකුගෙන් එක් අයෙකු පමණක් අනෙකුත් අපේක්ෂකයින්ට වඩා සජිත් ප්‍රේමදාසට මනාපය ප්‍රකාශ කර ඇත. මෙම හිටපු රාජපක්ෂ ඡන්දදායකයින් බොහෝ දුරට අනුර කුමාර දිසානායක සහ ජනාධිපති වික්‍රමසිංහ වෙත මාරු වී ඇති අතර, මෑත මාසවල

සහයෝගයේ උච්චාවචනයන්ට බොහෝ දුරට බලපා ඇත්තේ ඡන්දදායකයින් එක් අයෙකුගෙන් තවත් අයෙකුට මාරු වීමයි."

**අදාළ වාර්තා**

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 අප්‍රේල්, " 2023 මාර්තු IHP ජනාධිපතිවරණ ඡන්ද අභිප්‍රාය යාවත්කාලීන කිරීම: අනුර කුමාර දිසානායක (48%) සජිත් ප්‍රේමදාස (37%) අභිබවමින් ජනාධිපතිවරණයකදී පෙරමුණ ගනියි." *https://www.ihp.lk/publications/docs/SLOTSReport202309.pdf* යෙන් ලබා ගත හැකිය.

**සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය (IHP) පිළිබඳව**

IHP යනු ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටි ස්වාධීන, පක්ෂග්‍රාහී නොවන පර්යේෂණ මධ්‍යස්ථානයකි. SLOTS හි ප්‍රධාන විමර්ශකයා වන්නේ IHP හි ආචාර්ය රවී රන්නන්-එලිය මහතා යි. ඔහු හාවඩ් විශ්ව විද්‍යාලයේ මහජන මත විමසුම් සමීක්ෂණ පිළිබඳ පුහුණුව ලබා ඇති අතර දශක තුනක් පුරා විවිධ මත විමසුම් සමීක්ෂණ සිදු කරමින් සිටියි.

**ක්‍රමවේදය**

අහඹු ජංගම දුරකථන අංක ඇමතීමෙන් සම්බන්ධ කරගත් වැඩිහිටියන්ගේ (වයස අවුරුදු 18 සහ ඊට වැඩි) නියැදියක් සහ මීට පෙර අහඹු තෝරා ගැනීමකින් බඳවා ගන්නා ලද ප්‍රතිචාර දැක්වූවන්ගේ නියැදියකට සිදු කරනු ලැබූ සම්මුඛ පරීක්ෂණ, SLOTS මඟින් ඒකාබද්ධ කරනු ලබයි. යම් මාසයක ප්‍රකාශිත ඡන්දය තක්සේරු කිරීම සඳහා සියලුම SLOTS සම්මුඛ සාකච්ඡාවල දත්ත යොදා ගනිමින් Multilevel Regression and Post-Stratification (MRP) ආකෘතියකට ගැලපීම තුළින් එම ආකෘතියේ අවිනිශ්චිතතාවයන් සැලකිල්ලට ගෙන බහුවිධ ඇස්තමේන්තු (multiple imputation) භාවිත කරමින්, IHP විසින් ඡන්දය ප්‍රකාශ කිරීමේ අභිප්‍රාය ඇස්තමේන්තු කරයි.

2023 අප්‍රේල් MRP ඇස්තමේන්තු, එම මාසය තුල පැවැත්වූ සම්මුඛ පරීක්ෂණ 580ක් සහ 2021 අගෝස්තු 31 සිට 2023 මැයි 19 දක්වා පැවැත්වූ මුළු සම්මුඛ පරීක්ෂණ 11,368ක් මත පදනම් වන අතර AK දිසානායක සහ සජිත් ප්‍රේමදාස සඳහා 3-4%ක සහ අනෙකුත් ප්‍රධාන අපේක්ෂකයින් දෙදෙනා සඳහා 1-3%ක දෝෂ ආන්තිකයක් සමඟ ඇස්තමේන්තු කර ඇත. වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ජනවාර්ගිකත්වය, සමාජ ආර්ථික තත්ත්වය, අධ්‍යාපනය, භූගෝලීය පිහිටීම සහ 2019 ජනාධිපතිවරණයේ සහ 2020 මහ මැතිවරණයේ ඡන්දය ප්‍රකාශ කිරීමට අනුව නියැදිය ජාතික ජනගහනයට ගැළපෙන බව සහතික කිරීමට සියලු ඇස්තමේන්තු නැවත සකස් කර ඇත.

**අරමුදල් සැපයීම**

නීලන් තිරුචෙල්වම් භාරය, එක්සත් රාජධානියේ සෞඛ්‍ය හා සත්කාර පර්යේෂණ සඳහා වන ජාතික ආයතනය (NIHR), ශ්‍රී ලංකාවේ ආසියා පදනම සහ අනෙකුත් අනුග්‍රාහකයින් විසින් SLOTS සඳහා අරමුදල් සපයයි. නමුත් අධ්‍යයන සැලසුම්, සහ සොයාගැනීම් විශ්ලේෂණය සහ අර්ථකථනය කිරීමේදී අනුග්‍රාහකයින් කිසිදු කාර්යභාරයක් ඉටු නොකරයි. වඩාත් සවිස්තරාත්මක දත්ත සහ ප්‍රතිඵල සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට IHP සම්බන්ධ කර ගත හැකිය.